# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2384/42 - 2024 මැයි මස 17 වැනි සිකුරාදා - 2024.05.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 10/2015

**(351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත**

(351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 23 වන වගන්තිය සමග කියවිය යුතු 52 වන වගන්තිය යටතේ මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ නියෝග.

**ටිරාන් අලස්,**
මහජන ආරක්ෂක අමාත්‍ය.

2024 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1956 පෙබරවාරි මස 24 වැනි දින අංක 10,896 දරන ලංකා ආණ්ඩුවේ *ගැසට් පත්‍රය* සඳහා වූ අතිරේකයේ පළ කරන ලද, කලින් කල සංශෝධිත, 1956 ආගාමික හා විගාමික නියෝග, එහි 13 වන නියෝගයේ වගුවේ "2. සංචාරක වීසා" යන ශීර්ෂය යටතේ,-

(1) එහි දක්වා ඇති 1 වන අයිතමයේ "2024.03.31 දින දක්වා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2024.04.30 දින දක්වා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි දක්වා ඇති 4 වන සහ 5 වන අයිතම ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන්,-

| *වීසා පත්‍රය* | *වීසා පත්‍ර වර්ගය* | *ගාස්තුව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් (US $)* |
|---|---|---|
| 2. සංචාරක වීසා | සංචාරක කාර්ය | |
| | 4. සම්මත සංචාරක වීසා පත්‍ර - සංචාරක<br><br>චෙක් ජනරජය, මාලදිවයින, සීෂෙල්ස් සහ සිංගප්පූරුව හැර වෙනත් යම් රටක් සඳහා<br>(දින තිහක් දක්වා)<br>(එක් වරක් ඇතුළු වීම සඳහා) | *ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන්, මාර්ගගතව හෝ පැමිණීමෙන් පසු*<br><br>50.00 |
| | 5. සම්මත සංචාරක වීසා පත්‍ර - සංචාරක<br><br>මාලදිවයින හැර දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානයට (SAARC) අයත් රටවල් සඳහා<br>(දින එකසිය අසූවක් දක්වා)<br>(එක් එක් රැඳී සිටීම දින හැටක් දක්වා සීමා වේ) | *ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන්, මාර්ගගතව හෝ පැමිණීමෙන් පසු*<br><br>35.00 |
| | 5අ. සම්මත සංචාරක වීසා පත්‍ර - සංචාරක<br><br>දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානයට (SAARC) අයත් රටක්, චෙක් ජනරජය, සීෂෙල්ස් සහ සිංගප්පූරුව හැර වෙනත් යම් රටක් සඳහා<br>(දින එකසිය අසූවක් දක්වා)<br>(එක් එක් රැඳී සිටීම දින හැටක් දක්වා සීමා වේ) | *ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන්, මාර්ගගතව හෝ පැමිණීමෙන් පසු*<br><br>75.00 |

මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

EOG 05 - 0134

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.